# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

**Ministry of Industry and Entrepreneurship Development**


## “BIOFACH 2027” වෙළඳ ප්‍රදර්ශනයට සමගාමීව වෙළඳපොළ ගවේෂණ හා ධාරිතා සංවර්ධන වැඩසටහන 2027

## 2027 පෙබරවාරි 15 - 19 දක්වා ජර්මනියේ නියුරම්බර්ග් හිදී

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය )EDB), ජර්මනියේ බර්ලින්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව, **BIOFACH 2027** ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සමගාමීව, අපනයන හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වෙළඳපොළ ගවේෂණ හා ධාරිතා සංවර්ධන වැඩසටහනක් සංවිධානය කරයි මෙම වැඩසටහන .2027 පෙබරවාරි 16 සිට 19 දක්වා ජර්මනියේ නියුරෙම්බර්ග් නගරයේදී පැවැත්වේ.

### වැඩසටහනේ ප්‍රධාන අංග

- BIOFACH 2027 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වී ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම හා නිෂ්පාදන ප්‍රදර්ශනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
- ආහාර කර්මාන්තයට අදාළ නව වෙළඳපොළ ප්‍රවණතා, නවෝත්පාදන, තාක්ෂණයන් හා අලෙවිකරණ උපායමාර්ග අධ්‍යයනය කිරීම.
- ජර්මනියේ ආහාර සැකසුම් කර්මාන්තශාලා නැරඹීම.
- විභව ගැනුම්කරුවන් හා කර්මාන්ත හවුල්කරුවන් සමඟ B2B ව්‍යාපාරික හමුවීම් සහ ජාලගත වීමේ අවස්ථාවන්ට සහභාගී වීම.

### ඉලක්කගත පිරිස

පහත සඳහන් නිෂ්පාදන කාණ්ඩවල අපනයන ඉලක්ක කරගත් ආහාර හා පාන නිෂ්පාදන (විශේෂයෙන් කාබනික සහතික ලත්) .අපනයන සමාගම්වලින් අයදුම්පත් කැඳවනු ලැබේ/සැකසුම්

| | |
|---|---|
| • සැකසූ පලතුරු හා එළවළු (ශීත කළ, වියළන ලද හා සංරක්ෂිත පලතුරු හා එළවළු, පලතුරු යුෂ, ටින් කළ හා බෝතල් කළ නිෂ්පාදන) | • කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදන |
| • පොල් මද පදනම් කරගත් නිෂ්පාදන | • තේ, ඖෂධීය තේ සහ පාන වර්ග |
| • රසකැවිලි සහ බේකරි නිෂ්පාදන, විශේෂිත සහ පහසු ආහාර නිෂ්පාදන, ධාන්‍ය සහ ධාන්‍ය පදනම් කරගත් නිෂ්පාදන, සෞඛ්‍ය සඳහා ආහාර | • ආහාර අතිරේක )Food Supplements) හා පෝෂණීය අතිරේක )Nutraceuticals) |
| • වෙනත් ඕනෑම අපනයන විභවයක් සහිත ආහාර නිෂ්පාදන | |

### සහභාගීත්ව ගාස්තු

ගුවන් ගමන්, හෝටල් නවාතැන් හා අභ්‍යන්තර ප්‍රවාහන වියදම් සහභාගිවන්නන් විසින් දරාගත යුතුයගුවන් ගමන් හා අභ්‍යන්තර . ප්‍රවාහන වියදම්වලින් කොටසක් ලබාදීමට EDB විසින් සලකා බලනු ඇත.

### අයදුම් කිරීම

අයදුම්පත් **2026 අගෝස්තු 10** දින හෝ ඊට පෙර https://events.edb.gov.lk/market-exposure-biofach-2027 වෙබ් අඩවිය ඔස්සේ ඉදිරිපත් කළ යුතුය.

**වැඩි විස්තර සඳහා:** නිපුනි මුණසිංහ, සහකාර අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන අංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

දුරකථන: 011-2300716, 011-2300705-11 (දිගුව: 335)

සහභාගීවන්නන් තෝරාගැනීම EDB විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මඟින් සිදු කෙරේ..


සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
NDB - EDB Tower,
අංක 42, නවම් මාවත,කොළඹ 02.